# ලකී පුංචි බලු පැටියා




තෙහන්සා සිත්මිණි වර්ණකුලසූරිය

මහාමායා බාලිකා විදුහල

7- **A**

2026-06-09

978-624-211-377-7

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමයා බාලිකා විද්‍යාලයේ මුල්කත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නිම කල හැකියඟ දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දයාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයාග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මත ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවි ඇති ළමා ග්‍රන්ථ තුලින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වු පාසල් දරුවන් මඟ පෙන්වු ගුරු භවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමයා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබු භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

දවසක් හැන්දෑවක අපේ ගෙවල් ලඟ පාරේ චූටි බලු පැටියෙක් කවුදෝ දාලා ගිහින්.අනේ පවු චූ කෑ ගහනවා.එදා හොඳටම වැස්ස දවසක්.




මටයි නන්ගියටි හරිම දුක හිතුනා බලු පැටියාව දැක්ක ගමන්.එත් ඌව ගෙදර අරන් ගියොත් අම්මා බනීවී.ඒක නිසා ගෙදර ගෙනියන්නත් බෑ.



අපි දෙන්නා ගෙදර යනකොට ඌ අපේ පස්සෙන් ඇවිත් ගේ දොර ලගට වෙලා හිටියා.අපි බය හිතුනා අම්මා බනී කියලා.ඉක්මනට ගෙදරට ඇවිත් දොර වහ ගත්තා.



දොර ලඟ හිටපු බලු පැටියා හයියෙන් කෙදිරි ගාන්න පටන් ගත්තා.අම්මත් දුවගෙන ඇවිත් බැලුවා.අනේ බලු පැටියෙක් බිම දිගාවෙලා දොර අරින්න කියලා කෙදිරි ගානවා.



අපි බලු පැටියාට බොන්න කිරි හදලා දුන්නා.ඒත් ඌව ගෙදර තියා ගන්න නම් බැහැ අපේ ගෙදර ඉන්න දඩෝ්රියා හරිම සැරයි බලු පැටියාව හපලා දායී.



කිරි ටික පොවලා ආයෙමත් ඌව පාරට ගිහින් දාන්න කියලා අම්මා කිව්වා.අපිට දුක හිතුනා.අපි පොඩි පෙට්ටියක් ගෙනත් රෙදි කෑල්ලකුත් දාලා ඌව පාරේ තිබුනා කඩේ ගාවින් ගිහින් තිබ්බා.



දැන් ටිකක් රෑ වෙලා ඌ පෙට්ටිය ඇතුලෙම ගුලිවෙලා නිදාගත්තා.මම සහ නන්ගි ගෙදර ආවේ පහුවදා උදේම ගිහින් බලු පැටියාව බලමු කියලා හිතලා.



ගෙදර ඇවිත් අපි හිතුවේ බලු පැටියා ගැන  අපි දෙන්නා ඌට ලකි කියලා නමකුත් දැම්මා. හෙට උදේම ගිහින් ලකිව බලමු කියලා හිතලා අපි නිදාගත්තා



මමයි නන්ගියි වෙනදාටත් වැඩිය උදේම නැගිට්ටා බලු පැටියාව බලන්න. අපි අම්මාට කියලා කිරි එකක් හදාගෙන පාරේ කඩේ ගාවට ගියා.අපිව දැක්ක ගමන් ඌ ඉක්මනට දුවගෙන ආවා.



බලු පැටියාට කිරි දීලා කන්නත් දීලා අපි ඉස්කෝලේ යන්න ලැහැස්ති වුනා.අපි ඉස්කෝලේ යන්න යනකොටත් ලකී අපේ පස්සෙන්ම ආවා.ඌ පාරේ කඩේ ගාව නැවතුනා.අපි තාත්තා එක්ක ඉස්කෝලේ ගියා.යාලුවන්ටත් ලකී ගැන කිව්වා.හැමදාම අපි ඉස්කෝලේ ඉවර වෙලා එනකම් ලකී අපි දෙන්නා එනක්ම බලන් හිටියා.



අපි දෙන්නා ඉස්කෝලේ ඉවර වෙලා ගෙදර ආවේ හරිම සතුටින් බලු පැටියාව බලන්න.අපි එනකොට වෙනදා වගේ ලකී අපි ලගට දුවගෙන ආවේ නෑ.අපි පාරේ හැමතැනකම හෙව්වා ඒත් බලු පැටියා හිටියේ නෑ.මගෙයි නන්ගිගෙයි ඇස් වල කදුලු පිරුනා.කඩේ ගාය හිටිය බලු පැටියා කවුදෝ අරන් ගියා කියලා කඩේ නැන්දා අපිට කිවුවා.අපි දෙන්න දුකින් ගෙදර ගියා.ඒත් ඌ ඉන්න තැනක සතුටින් සැපෙන් ඉදියි කියලා අපි හිත හදාගත්තා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

